## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2011

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්යක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

ප්‍රධාන කාර්යාලයේ සහ බේරුවල ශාඛාවේ යන්ත්‍ර සූත්‍ර රු.6,535,149 කට ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 (70) වගන්තියට අනුව හෙළිදරව් කළ යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි.

##### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ණයහිමියන් වෙත ලියන ලද රු.21,500 ක් වූ චෙක්පත් 4 ක්, මාස 6 ක් ඉකුත්වීම නිසා අවලංගු කර තිබුණු අතර නැවත ණයහිමියන් ලෙස හෝ ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වුවත් වර්ෂයේ වියදම්වලින් කපා හැර තිබුණි.

(ආ) 2010 හා 2011 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු.196,000 ක් වන අතර ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණේ රු.96,000 ක් පමණි.

(ඇ) 2010 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.33,950 ක් වූ ගොඩනැගිලි නඩත්තු වියදම සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි.

(ඈ) වැරදි සටහන් නිවැරදි කිරීමේදී ආදායමට හර කළ යුතු රු.16,520 ක් බැංකු ගාස්තු ගිණුමට හර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පර්තෝෂිත වෙන්කිරීම් රු. 13,238 කින් අඩුවෙන් වෙන්කර තිබුණි.

(ඊ) එකතුව රු. 1,171,152 ක් වූ ලැබීම් හා රු. 2,998,049 ක් වූ ගෙවීම් සඳහා පිළිවෙලින් ලැබීම් කුවිතාන්සි හා ගෙවීම් වවුචර් මගින් මුදල් පොතේ සටහන් කිරීම වෙනුවට ජ'නල් සටහන් මගින් මුදල් පොතේ ගැලපුම් කර තිබුණි.

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මලාය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| ගෙවිය යුතු වියදම් | 620,296 | උපලේඛන |
| බැංකු ශේෂ | 2,841,278 | ශේෂ සනාථ කිරීම් |
| ගෙවීම් (මුදලින්) | 1,376,495 | බිල්පත් , මිල කැඳැවීම්, ලිපිගොනු |
| ගෙවීම් | 613,184 | ගෙවීම් වවුචර |
| සුළු මුදලින් ගෙවීම් | 182,426 | බිල්පත් |
| ජ'නල් සටහන් | - | අනුමැතිය, අදාළ තොරතුරු, සංලක්ෂය |
| ප්‍රදර්ශන වියදම් | 134,709 | බිල්පත් , ඇස්තමේන්තු හා ලිපිගොනු |
| වීඩියෝ පටයක් නිෂ්පාදනය | 366,000 | ඇස්තමේන්තු මිල ගණන් කැඳවීම හා කොන්ත්‍රාත්කරු තෝරා ගත් පදනම |
| වායු සමීකරණ යන්ත්‍ර හා ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 381,017 | ඇස්තමේන්තු හා මිල ගණන් කැඳවීම් |

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත | |
| 14 (4) වගන්තිය | පාලක මණ්ඩල රැස්වීමක ගණපූර්ණය සඳහා සාමාජිකයින් 5 දෙනෙකු සිටිය යුතු වුවත් ගණපූර්ණය නොමැතිව රැස්වීම් පැවැත් වූ අවස්ථා 5 ක් නිරීක්ෂණය විය. |

(ආ) 1971 අංක 38 දරන මුදල් පනත
11 වගන්තිය

රාජ්‍ය සංස්ථාවක අරමුදල් ආයෝජනය කිරීම සඳහා අදාළ අමාත්‍යවරයාගේ ලිඛිත අවසරය ලබාගත යුතු වුවත්, රු. 3,190,864 ක් ආයෝජනය කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| i. 5.2.1 වගන්තිය | 2009 , 2010 හා 2011 වර්ෂයේ අයවැය ලේඛනය සමග පුරෝකථනය කල ශේෂපත්‍රයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| ii. 5.2.5 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත කරන ලද අයවැය ලේඛනයෙහි පිටපත් අදාළ අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට, මුදල් අමාත්‍යාංශයට සහ විගණකාධිපති වෙත අදාළ වර්ෂය ආරම්භයට දින 15 කට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වුවත ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| iii. 6.5.1 වගන්තිය | වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. |
| iv. 6.6 වගන්තිය | 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ DMS/ E4 / 37 / 7 / 235 / 2 හා 2011 පෙබරවාරි 23 දිනැති ලිපියේ 07 වගන්තිය | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධානවලට අනුකුල වන පරිදි බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටීන් සකස් කර අනුමත කර ගත යුත වුවත්, බඳවා ගැනීමේ පරිපාටීන් පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණි. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

i. මු.රෙ. 225 (1) හා (2)

නියමිත ආකෘති පත්‍රයකින් තොරව ආයතනය විසින් භාවිතා කරන ලද ගෙවීම් වවුචර්වල , පිළයෙල කිරීම, ගෙවීම් නිර්දේශ කිරීම, අනුමත කිරීම හා ගෙවීම් කිරීමට වගකිව යුතු නිලධරින්ගේ අත්සනකින් තොරව වවුචර් 1257 ක් සඳහා ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

ii. මු.රෙ. 371 (2) (ඇ)

ආයතනය විසින් තත්කාර්යය අතුරු අග්‍රිම ලබා ද තිබුණු අතර ඒ සම්බන්ධව ලේඛනයක් පවත්වාගෙන නොතිබුණු අතර අත්තිකාරම් කාර්යය නිම වු විගස පියවීම් කර ද නොතිබුණි.

iii. මු.රෙ. 371 (3)

මුද්‍රණ ආයතනයේ සුළුමුදල් අග්‍රිමය පිළිබඳව මුදල් රෙගුලාසි අනුව ගෙවීම් වල උපරිම සීමාවක් නියම කර නොතිබීම නිසා සුළු මුදල් අග්‍රිමයෙන් රු. 1,000 සිට රු. 4,710 දක්වා ගෙවීම් සිදුකරන ලද අවස්ථා 39 ක් නිරීක්ෂණය විය. 2011 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය පියවීමටද කටයුතු කර නොතිබුණි.

iv. මු.රෙ. 395(ඇ)

එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනුවල තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

v. මු.රෙ. 396(ඇ)(ii)

නිකුත් කර මාස 06 ක් කල් ඉකුත් වුවද ගෙවීමට ඉදිරිපත් නොවු රු.12,000 ක චෙක්පත් 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| IX වන පරිච්ඡේදයේ 2 වන වගන්තිය | ආයතනයේ නිලධාරීන් පාඨමාලා සඳහා දේශන පැවැත්වීමේදී එම නිලධාරීන්ට ගෙවන ගාස්තු වලින් 10 % ක් වූ රාජ්‍ය භාගය අඩුකර ආදායමට ගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

(උ) අමාත්‍යාංශ චක්‍රලේඛ

| | |
|---|---|
| අංක ටීවීඊටී /1/ච.ලේ / 2004 /1 හා 2004 ජනවාරි 28 දිනැති චක්‍රලේඛයේ 1.1.1 වගන්තිය. | අවම සංඛ්‍යාවට අඩු ආධුනිකයින් සංඛ්‍යාවක් ඇති පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකළ අවස්ථා 10 ක් නිරීක්ෂණය විය. |
| (ඌ) අංක 1530/3 හා 2008 ජනවාරි 21 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය | වටිනාකම රු.25,000 කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අය කළ යුතු වුවත් සියළුම ගෙවීම්වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

1.2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

නිලධාරීන්ගේ වාර්ෂික නිවාඩු සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීම වෙනුවට සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ ආඥා පනතේ විධිවිධාන අනුගමනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිකාල දීමනා සඳහා රු.50,419 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

1.2.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ලේ කොටසක ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යන අතර විදුලි කටයුතු නඩත්තුව, ගෘහ භාණ්ඩ නඩත්තුව හා පරිගණක විද්‍යාගාර යන අංශ නඩත්තුව සඳහා සේවකයින් තිදෙනෙකුට වර්ෂය තුළදී මාසික පදනම මත රු.93,000 ක් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 23 දිනැති හා අංක DMS / E4 / 37 / 7 / 235 / 2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (1) පරිදි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ කාර්ය්‍ය මණ්ඩලයේ සියළු සාමාජිකයින් පිහිටුවිය යුතු වැටුප් පරිමාණයන් දක්වා තිබුණි. එහෙත් එම චක්‍රලේඛයට පටහැනිව වෙනස් වැටුප් පරිමාණයන්හි පිහිටුවා ගෙවීම් කිරීම හේතුවෙන් වැටුප් සඳහා රු. 601,320 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.3,111,389 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,412,259 ක් වයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,300,870 ක පිරිහීමට හේතු වූ කරුණු පහත දැක්වේ.

| විස්තරය | විචලනය | | |
|---|---|---|---|
| | හිතකර | අහිතකර | වෙනස |
| | රු. | රු. | රු. |
| ආදායම් | 929,452 | - | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | - | 22,795 | |
| පරිපාලන වියදම් | - | 715,714 | |
| මූල්‍ය හා වෙනත් වියදම් | - | 1,554,258 | |
| ශාඛාවල ශුද්ධ අතිරික්තය / ඌණතාවය | 62,445 | - | |
| | 991,897 | 2,292,767 | 1,300,870 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ පාඨමාලා 22 ක් හා ශාඛාවල පාඨමාලා 3 ක සැලසුම් කර තිබුණු අතර සැලසුම් කළ පාඨමාලා 06 ක් පවත්වා නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කළ පාඨමාලාවන් 6 ක් සඳහා ශිෂ්‍යයන් 119 ක් බඳවා ගැනිමට අපේක්ෂා කර තිබුණද එම පාඨමාලා නොපැවැත්වීම නිසා අපේක්ෂිත ආදායම කරා ලඟාවී නොතිබුණි.

(ඇ) බේරුවල ශාඛාවේ 2011 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා සඳහා අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 50 ක් වූ අතර සත්‍ය වශයෙන් සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව 09 කි. එය අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 18% කි. මේ අනුව 2010 වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවීම 244 % ක් පමණ විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද පාඨමාලා සඳහා බඳවා ගැනිමට අපේක්ෂා කළ ප්‍රමාණයට ලඟාවීමට නොහැකිවීමේ ප්‍රතිශතය 11% සිට 80% පරාසයක විය. විස්තර පහත දැක්වේ.

| පාඨමාලා | අපේක්ෂිත බඳවා ගැනිම් | තථ්‍ය බඳවා ගැනිම් | ඉලක්ක කරා ලඟා නොවීම් | ඉලක්කකරා ලඟා නොවීම් අපේක්ෂිත බඳවා ගැනිම්වල ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|---|
| ඕෆසෙට් ලිතෝ ග්‍රැපී (Offset Lithography) | 30 | 21 | 9 | 30 |
| පරිගණක යතුරුලියනය හා ඩෙක්ස්ටොප් ප්‍රකාශනකරණය (Computer Typesetting and Desktop Publishing | 180 | 161 | 19 | 11 |
| ජාල නිර්මාණය (Web Design) | 60 | 21 | 39 | 65 |
| නන් ලිනර් එඩිටින් (Non Liner Editing ) | 30 | 15 | 15 | 50 |
| පරිගණක චිත්‍රණ කර්මාන්තය සඳහා පරිගණක දෘඪාංග හා පරිගණක එකලස් කිරීම (Computer Hardware & PC Assembly for Graphic Art Industry) | 28 | 11 | 17 | 61 |
| මයික්‍රෝසොෆ්ට් ඕෆස් (MS Office) | 20 | 11 | 9 | 45 |
| මුද්‍රණ තාක්ෂණ හා කළමනාකරණ උසස් ඩිප්ලෝමාව Advanced Diploma in Print Technology Management | 15 | 9 | 6 | 40 |
| Computer Graphic Designing (Matale) | 40 | 32 | 8 | 20 |
| Web Design (Matale) | 10 | 4 | 6 | 60 |
| Computer Graphic Designing (Beruwala) | 25 | 5 | 20 | 80 |
| Microsoft Office (Beruwala) | 10 | 4 | 6 | 60 |

(ඉ) ශාඛාවලින් සමස්ථ ලාභයට වන දායකත්වය අවම වීම

ප්‍රධාන කාර්යාලයේ 2011 වර්ෂයේ ලාභය රු. 3,111,389 ක් වන විට මාතලේ ශාඛාවේ ලාභය රු.86,870 ක් සහ බේරුවල ශාඛාවේ අලාභය රු.70,132 ක් විය. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම ශාඛා දෙකෙන් ආයතනයේ සමස්ථ ලාභයට වන

දායකත්වය ඉතාම අවම මට්ටමක පැවති අතර 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව බේරුවල ශාඛාවෙහි කිසිම ආදායමක් නොලබා වියදම රු.70,132 ක් වී තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

දේශන ගාස්තු ගෙවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. එක් එක් පාඨමාලාවට අදාළව දේශකවරුන් හා උපදේශකවරුන් සඳහා ගෙවීම් කිරීමේදී ඒ සඳහා ලබාගන්නා ලද අනුමැතීන් ඇතුළත් ලිපිගොනු ආයතනය විසින් පවත්වා ගෙනගොස් නොතිබූ අතර ගෙවීම් කිරීමේදී ගෙවනු ලබන ගාස්තු අවස්ථා 53 කදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කර තිබුණි.

ii. එමෙන්ම අධ්‍යකෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දේශන ගාස්තු ප්‍රමාණයන් ඉක්මවා ගෙවීම් කර තිබුණු අතර මාස 6 ක නියැදි පරීක්ෂාවේදී රු.93,092 ක මුදලක් එසේ වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

iii. දේශකයන්ට අතිකාල ගෙවීමේදී ප්‍රමාද වී පැමිණීම් ආවරණය කිරීමෙන් පස අතිකාල පැය ප්‍රමාණය ගණනය කළ යුතු වුවද , එසේ කර නොතිබුණි.

3.3 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ උපයාගත් ආදායම්වලින් උපයෝජනය නොකර වර්ෂය අවසානයට බැංකු ජංගම ගිණුමක රඳවා තිබුණු මුදල රු.2,452,805 ක් නිරීක්ෂණය විය. මෙම මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගැනිමට කටයුතු කර නොතිබුණි. එක් බැංකු ගිණුමක මාසය ආරම්භයේ පැවති ශේෂය මාසික වියදම මෙන් 4 ගුණයේ සිට 10 ගුණයකට පැවැති අවස්ථා නිරීක්ෂණය විය.

3.4 නිෂ්ක්‍රිය ඌණ උපයෝජිත වත්කම්

තෘතියික හා කාර්මික අධ්‍යාපන කොමිෂන් සභාවෙන් පුහුණු උපකරණ මිලදී ගැනීමට ලබා දී තිබුණු රු.1,999,975 ක් අදාළ උපකරණ මිලදී නොගැනීම හේතුවෙන් එම මුදල් නිෂ්ක්‍රියව පැවතුණි.

3.5 අර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 අප්‍රේල් 20 දින වන විටත් නිම කර නොතිබුණු සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම සඳහා ඉකත් වර්ෂයේ රු.65,000 ක් වැයකර තිබුණු අතර එය පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසුව එහි සංශෝධනයන් කිරීමට රු.37,000 ක් සමාලෝචිත වර්ෂයේ වැයකර තිබුණ ද, එම සංයුක්ත සැලැස්ම 2012 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීණි.

(ආ) ආයතනයෙ පොත් තැබීම හා ගිණුම් පිළිබඳව කටයුතු කිරීමට රු.16,390 ක වැටුපකට නිලධාරිණියක බඳවාගෙන තිබියදී, බැංකු සැසඳුම් පිළියෙල කිරීම හා ගිණුම් පිළියෙල කිරීමේ කටයුතු සඳහා රු.121,316 ක් බාහිර පාර්ශවයකට ගෙවීම් කර තිබුණි.

3.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2004 දෙසැම්බර් 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ නමුත් වර්ෂ 05 ක් ඉක්මවා යන තුරුත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණු අතර යෝජිත ඉඩම පවරා ගැනීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි. ඉඩම් පවරා ගැනීමට පෙර ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් කිරීම සඳහා රු.227,370 ක් 2009 වර්ෂයේ දී ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම සහ එහි ක්‍රියාකාරීත්වය

2003 ජුනි 2 දින හා අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාර සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවත් එය බාහිර පුද්ගලයෙකුට සැකසීමට භාර දී ඇතත් මේ දක්වා නිම කර නොතිබුණි.

4.2 අයවැය ලේඛනමය පාලනය

ප්‍රධාන කාර්යාලය, මාතලේ සහ බේරුවල ශාඛාවල සමාලෝචිත වර්ෂයට අදාලව විෂයයන් 18 ක් යටතේ අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු. 1,769,161 ක වියදමක් දරා තිබුණු අතර වැය විෂයයන් 10 ක් යටතේ රු. 1,325,558 ක ඉතිරියක් දක්නට ලැබුණි. එමෙන්ම අයවැයගත නොකල රු.967,604 ක ආදායමක්ද විය. ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා කාර්යාලවල ඇස්තමේන්තුගත පාඨමාලා ආදායම පිළිවෙලින් රු.1,053,390 කින් හා රු. 740,850 කින් අඩු වී තිබුණි. මේ අනුව අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) සැලැස්ම සකස් කිරීම
(ඇ) පාඨමාලා පැවැත්වීම
(ඈ) පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම
(ඉ) බැංකු සැසඳුම් හා මුදල් පොත
(ඊ) අභ්‍යාන්තර පාලනය